# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2019 අගෝස්තු මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 ජූලි මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[293 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ආනයනය කළ භාණ්ඩවල වටිනාකම නිශ්චය කිරීමට සහ නිශ්චිතව දක්වන ලද භාණ්ඩවල වටිනාකම නිශ්චය කරනු ලබන ආකාරය නියම කිරීමට අමාත්‍යවරයාට බලය ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ආනයනය මත පදනම් වූ සමාගම් විසින් දේශීයව විකුණනු ලබන ඇතැම් ඇගළුම් සඳහා ගෙවීමට නියමිත බදු මුදල වැඩි කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, එකතු කළ අගය මත බදු ගෙවීමේ දිනය වෙනස් කිරීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් සහාධිපත්‍ය නිවාස ඒකක සැපයුම් සම්බන්ධයෙන් වන ලියාපදිංචි ගිවිසුම 2019 අප්‍රේල් මස 1 වන දිනට පෙර ලියා අත්සන් කර ඇත්නම් එවැනි සැපයුම්, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම, සහ දේශීයව නිෂ්පාදිත සහල් නිෂ්පාදන සඳහා ලබා දී ඇති බදු නිදහස් කිරීම සහ නිවුඩු තෙල් දක්වා දීර්ඝ කිරීම සිදුකර 2018 අයවැය යෝජනා බලාත්මක කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්. ඩී.— ඕ. 5/2019

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක   දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

''ආනයනය කළ භාණ්ඩවල වටිනාකම.

6. (1) නියෝග මගින් නියම කරනු ලබන භාණ්ඩ හැර ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම-

(අ) තීරුබදු කාර්යය සඳහා නිශ්චය කරන ලද භාණ්ඩවල වටිනාකම සියයට දහයකින් වැඩි කළ අගය; සහ

(ආ) ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු යම් තීරුබදු මුදලට ගෙවිය යුතු යම් අධිභාරයක්, සෙස් බද්දක්, 2002 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් සහ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ද ඇතුළුව ගෙවිය යුතු මුදල් ප්‍රමාණය,

යන දෙකෙහි එකතුව විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබූ භාණ්ඩවල වටිනාකම නිශ්චය කරනු ලබන ආකාරය අමාත්‍යවරයා විසින්, කලින් කල, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා

විසින් සාදනු ලබන එවැනි යම් නියෝගයක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය. එම නියෝග පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව පමණක් බලාත්මක වන්නේ ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ (අ) ඡේදයේ (iii) වන සහ (iv) වන උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

''(iii) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම් (panties), මේස්, පිරිමි යට කලිසම් (briefs) සහ බොක්සර් කොට කලිසම් හැර එවැනි එක් එක් ඇඟළුමක් සඳහා 2018 අගෝස්තු මස 16 වන දින හෝ එදිනට පසුව එහෙත් 2019 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් හැත්තෑපහක් වන අතර, 2019 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් සියයයි;

(iv) රේගු කාර්යය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති කාන්තා යට කලිසම් (panties), මේස්, පිරිමි යට කලිසම් (briefs) සහ බොක්සර් කොට කලිසම් කෑලි හයක් සඳහා 2018 අගෝස්තු මස 16 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2019 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් හැත්තෑපහක් වන අතර, 2019 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා රුපියල් සියයයි;''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි (1අ) වන උපවගන්තියේ ''2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2019 ජූලි මස 1 වන දිනට පෙරාතුව'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (xi) අයිතමයේ-

(අ) (ආ) වන අනු අයිතමයේ, “2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින්” යන වචන සහ ඉලක්කම් වෙනුවට “2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2019 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව යම් තැනැත්තකු විසින්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) අනු අයිතමයේ “රුපියල් මිලියන පහළොවක් නොඉක්මවන්නා වූ සැපයුම්.”; යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන්නා වූ සැපයුම්; හෝ

(iii) එම සැපයුම් යම් සහාධිපත්‍ය නිවාස ඒකකයක විකිණීමකට සම්බන්ධ සහ එම සැපයුම සම්බන්ධයෙන් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ විධිවිධාන යටතේ ලියා අත්සන් කරන ලද විකිණීමට එකඟවීමේ ගිවිසුමක් ඇති අවස්ථාවක දී; හෝ

(iv) එම සැපයුම්, අදාළ පළාත් පාලන ආයතනය විසින් මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් ඇති සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතියක සහාධිපත්‍ය නිවාස ඒකකයක් සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවක දී.”;

(2) (xxvi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින්:-

"(xxvi) සීනි හෝ වෙනත් රස කළ ද්‍රව්‍ය අඩංගු කිරිපිටි හැර, එම කිරි ලංකාවේ නිෂ්පාදනය කරන තාක් දුරට දේශීයව නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කළ කිරි නිෂ්පාදන සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සහල් අඩංගු දේශීයව නිෂ්පාදිත සහල් නිෂ්පාදන සහ, (2019 ජූලි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි) දේශීයව නිෂ්පාදිත සහල්වලින් දේශීයව නිෂ්පාදිත සහල් නිවුඩු තෙල්;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.